

# ශ්‍රී ලාංකික ජනතාවගේ සහ දේශයේ සෞභාග්‍ය වෙනුවෙන් කැප වී සිටින අප සමඟ හවුල්කරුවකු වන්නට ඔබත් කැමතිද?

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩුව ඇති පහත තනතුරු සඳහා පළපුරුදු වෘත්තීයමය පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය
## සහකාර සාමාන්‍යාධිකාරී - අරමුදල් කළමනාකරණ

### මූලික සුදුසුකම්

1. අවම වශයෙන් පහත සඳහන් එක් වෘත්තීමය ආයතනයක සාමාජිකත්වය ලබා තිබිය යුතුය.
    a. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL)
    b. සහතිකලත් වරලත් ගණකාධිකාරීන්ගේ සංගමය (ACCA)
    c. වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CIMA)

    (පිලිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ පශ්චාත් උපාධියක් හෝ බැංකුකරණය පිලිබඳ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.)
2. වසර 15 ක පළපුරුද්දක් තිබීම. ඉන් වසර 08ක පළපුරුද්දක් බැංකුකරණ/මූල්‍ය ක්ෂේත්‍රයේ විය යුතු අතර, ඉන් වසර 03ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.
3. වයස අවු. 50ට අඩු විය යුතුය.

### වැටුප් පරිමාව

තෝරාගනු ලබන අයදුම්කරු බැංකු ක්ෂේත්‍රයේ පවත්නා සම්මත, ආකර්ෂණීය දීමනාවන් සහිත වැටුපකට හිමිකම් කියනු ලබයි.

## සහකාර කළමනාකරු - මූල්‍ය (කොන්ත්‍රාත් පදනම මත)

1. අවම වශයෙන් පහත සඳහන් එක් වෘත්තීමය ආයතනයක සාමාජිකත්වය ලබා තිබිය යුතුය.
    a. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL)
    b. සහතිකලත් වරලත් ගණකාධිකාරීන්ගේ සංගමය (ACCA)
    c. වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CIMA)

    (පිලිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ පශ්චාත් උපාධියක් හෝ බැංකුකරණය පිලිබඳ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.)
2. බැංකුකරණ/මූල්‍ය ක්ෂේත්‍රයේ අවම වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම.
3. දත්ත විශ්ලේෂණ හැකියාව සහ වාර්තා සැකසීමේ හැකියාව සහිත වීම.
4. වයස අවු. 30ට අඩු විය යුතුය.

### වැටුප් පරිමාව

මෙම පත්කිරීම මූලිකව වසර 01 ක කොන්ත්‍රාත් කාලයකට යටත්ව සිදුකරනු ලබන අතර, සාර්ථක ලෙස පළමු කොන්ත්‍රාත් වසර නිමකරන්නන් දෙවන වසර සඳහා සලකා බලනු ඇත. කොන්ත්‍රාත් කාල සීමාව තුළ රු. 100,000/- ස්ථාවර මාසික දීමනාවකට හිමිකම් කියනු ලබයි.

### අයදුම් කළ යුතු ආකාරය

තමා පිලිබඳව විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ තොරතුරු සහිතව තම ජීව දත්ත තොරතුරු ඇතුළත් සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2022 ඔක්තෝබර්** 14 දින හෝ ඊට පෙර careers@rdb.lk විද්‍යුත් ලිපිනයට යොමු කරන්න. එහි විෂය (subject) තීරයේ අයදුම්කරනු ලබන අදාළ තනතුර සඳහන් කරන්න.

තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ සහ මෙම බඳවා ගැනීම කල් තැබීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank
"BBB+" Negative ICRA Lanka


ප්‍රධාන මානව සම්පත් නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැළණිය.

0112 42 52 62 | www.rdb.lk